# දිවිනැගුම ගෙවතු වගා වැඩසටහනෙහි ක්‍රියාත්මකභාවය ඃ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ආර්. එස්. කුමාරි සහ තවත් අය[1]***
***එම්.කේ. නදීකා දමයන්ති [2]***

සංක්ෂේපය

සීඝ්‍ර ජනගහන වර්ධනයත් සමඟ ලෝකය දිනෙන් දින ආහාර සහ දිළිඳුකම පිළිබඳ ගැටලුවලට මුහුණ දෙමින් සිටින අතර ශ්‍රී ලංකාව ද මෙම තත්ත්වයට මුහුණ දෙමින් සිටී. මෙහිදී පසුගිය රජය විසින් මෙම ගැටලුවලට එක් පිළියමක් වශයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර ගෙවතු වගා වැඩසටහන එහි මූලික අංගයක් විය. මේ යටතේ දිවයින පුරා ගෙවතුවගා දශලක්ෂයක් සංවර්ධනය කිරීමට ඉලක්ක කරන ලදී. මේ වනවිට දිවිනැගුම ගෙවතු වගා වැඩසටහන අක්‍රීය මට්ටමක පැවතියත් නැවතත් ගෙවතු වගා වැඩසටහන ආරම්භ කිරීම පිළිබඳ රජයේ අවධානය යොමුවී ඇති බව මාධ්‍ය වාර්තා හරහා අනාවරණය වේ. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වන්නේ දිවි ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මතුවූ ගැටලු මොනවාද? යන්න අධ්‍යයනය කිරීමයි. එහිදී බහුපිය නියැදි ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ බහුතර පවුල් සංඛ්‍යාවක් ගෙවතු වගාවෙහි නිරත වන ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අධ්‍යයන ප්‍රදේශය වශයෙන් තෝරා ගැනිණි. ප්‍රාදේශීය ලේකම් සමඟ සිදු කරනු ලැබූ සාකච්ඡාවලින් පසුව අධ්‍යයනය සඳහා නාතුඩුව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම තෝරා ගැනිණි. අධ්‍යයනය සඳහා ගෙවතු වගාවේ නිරත වූ පවුල් 60ක් අහඹු ලෙස තෝරාගත් අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මගින් ද නිරීක්ෂණය මගින් ද ප්‍රාථමික තොරතුරු සම්පාදනය කර ගැනිණි. ප්‍රතිචාරීන්ගෙන් 48%ක් එළවළු සහ පලතුරු යන දෙවර්ගයම වගා කර ඇති අතර එළවළු, පලතුරු සහ ස්ථිර භෝග වගා කිරීම සඳහා පැළ සහ බීජ ලබාගත් ප්‍රතිශතය 37%කි. ප්‍රතිචාරීන්ගෙන් 68% දෛනික පරිභෝජනය සඳහා ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට ද, 13%ක් ස්වයං රැකියාවක් ලෙස ද, 3% ආත්ම තෘප්තිය සඳහා ද, 15% ඉහත සියලුම අරමුණු වෙනුවෙන් ද ගෙවතු වගාවට යොමුවී ඇත. ප්‍රතිචාරීන් මුහුණ දුන් ගැටලු අතුරින් ලබාදුන් රෝපණ ද්‍රව්‍ය පැළ නොවීම (10%), පැළ වූ රෝපණ ද්‍රව්‍ය කෙටි කලකින් මියයාම (15%), රෝගී පැළ ලබාදීම (2%), අපේක්ෂිත මට්ටමින් අස්වැන්න නොලැබීම (3%) සහ ඉහත සියලුම කරුණු (70%) ප්‍රමුඛ වේ. මෙයට අමතරව ගෙවතු වගාව සාර්ථක නොවීම සඳහා ප්‍රමාණවත් භූමියක් නොවීම (48%), ජල පහසුකම් සඳහා මුදල් වැය කිරීමට සිදුවීම (88%), නිසි උපදේශන සේවා නොලැබීම (35%), නිලධාරීන් පෞද්ගලික සම්බන්ධතා මත කටයුතු කිරීම ආදිය ද ප්‍රතිපත්තියේ ක්‍රියාත්මක භාවයෙහි ගැටලු මතු කිරීමට දායක වී ඇත.

ප්‍රමුඛ පද ඃ දිවිනැගුම, ගෙවතු වගාව, ගම්පහ දිස්ත්‍රික්කය, රාජ්‍ය ප්‍රතිපත්ති

1 *කේ.ඩී.එන්.එම්. මල්රේණු, ආර්.එම්.ආර්.ඩී. රත්නායක, කේ.එල්.අයි. අක්ෂිකා, ඩබ්.එන්.එම්. තිසේරා, එස්.එම්.ජ්.ඩී. සුබසිංහ, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

2 *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*